# ඇහැලේපොල පූජා කළ
# දළදා කරඬුව



අනුරාධ සෙනෙවිරත්න

# ඇහැලේපොල පූජ කළ දළඳ කරඬුව.

ආචාර්ය අනුරාධ සෙනෙවිරත්න

උඩරට රාජ්‍යයේ බිඳ වැටීමත්, ඉංග්‍රීසි ආධිපත්‍යයේ ආරම්භයත්, ඉංග්‍රීසිනට විරුද්ධව උඩරට සිදුවූ මහ කැරැල්ලත් සම්බන්ධයෙන් ඇහැලේපොලගෙන් සිදුවූ සේවාව ලංකා ඉතිහාසයේ අමරණීය වෙයි. උඩරට රාජධානියේ අවසාන රජ වූ ශ්‍රී වික්‍රමරාජසිංහ (1798-1815) ගේ කෲරකම් වලට එරෙහිව සටන් වැදී සිහසුනෙන් ඔහු නෙරපා හැරීමට ඇහැලේපොල එද ඉංග්‍රීසින්ගේ සහාය පැතූ අන්දමත්, අවසානයේදී ඉංග්‍රීසීන් පාලනයෙහි තබා තම අපේක්ෂා වන් හා ජාතියේ අභිවෘතාර්ථයන්ද සුණු විසුණු කොට ගෙන පරාජිතයෙකු වූ සැටිත්, කියැවෙන ඇහැලේපොලගේ චරිතාපදානය එකම ශෝකාන්තයෙකි. මෙකී ක්‍රියාදාමය තුළින් ඔහු ලැබූ එකම ජයග්‍රහණයත්, ප්‍රීතියත් වූයේ වඩිග රජු සිහසුනෙන් නෙරපීම පමණෙකි. එම පරමාර්ථය ද සපුරා ගත්තේ තම දරු පවුල පවා කෲර රජතුමකු අතින් මැරුම් කෑමෙනි.

ඉංග්‍රීසීන්ට උඩරට රාජ්‍යය ලබා දීමෙන් ඇහැලේපොල අපේක්ෂා කළේ උඩරට රජකමය.[1] එහෙත් කපටි උපාය මාර්ගයෙන් රාජ්‍යය ලබාගත් ඉංග්‍රීසීහු තම පරමාර්ථය මුදුන්පත් කොට ගත්හ. ඉංග්‍රීසීහු 1818 මාර්තු 3 ද ඇහැලේපොල සිරභාරයට පමුණුවා 1825 වන තෙක් කොළඹ රඳවා තබා 1825 දී මුරුසි දිවයිනට පිටුවහල් කොට හැරියෝය. ඉන් වසර හතරකට පමණ පසු 1829 අප්‍රේල් මස රෝගාතුර වූ ඇහැලේපොල විසිහතර වැනිද මිය ගියේය. මිය යන විට ඔහුගේ වයස අවුරුදු 56 කි. දේශයේ නිදහස වෙනුවෙන් සටන් කළ ඇහැලේපොල වෙනුවෙන් මුරුසි දිවයිනේ ඉදි වූ සිහිවටනය ඔහුගේ හුදකලා ජීවිතයත්, ඒකපුද්ගල සටනත් පිළිඹිබු කරන සංකේතයක් වැන්න.

උඩරට රාජ පරම්පරාව යටතේ නොයෙකුත් පදවි ඉසුලූ කීර්තිමත් ඇහැලේපොල පරපුරට දාව ඉපදුණු '' ඇහැලේපොල විජයසුන්දර වික්‍රමසිංහ චන්ද්‍රසේකර සෙනෙවිරත්න අමරකෝන් වාසල පණ්ඩිත මුදියන්සේ රාළහාමි[2] මාතලේ ඇහැලේපොල ග්‍රාමයේදී 1773 දී උපත ලැබීය. ඔහුගේ පියා ඌවේ දිසාපති වරයා විය. මව පිළිමතලව්වේ පෙළපතට අයත් වූවාය. කුඩා කල යටවත්තේ හා කොබ්බෑකඩුවේ නායක හිමිවරුන් වෙතින් භාෂා ශාස්ත්‍රය ද බුද්ධ ධර්මයද උගත් ඔහු නිසි වියට පැමිණි කල පිළිමතලව්වේ මහ අදිකාරම්ගේ දියණිය හා විවාහ වූයේය. රාජාධිරාජසිංහ (1781-1798) හා ශ්‍රී වික්‍රමරාජසිංහ යන දෙරජවරුන් යටතේ ඔහු නොයෙකුත් තනතුරුද දැරීය. ශ්‍රී වික්‍රමරාජසිංහ රජු යටතේ 1803 දී සත්කෝරලේ දිසාපති පදවිය දැරූ ඇහැලේපොල පසුව මීගස්තැන්නේ අදිකාරම්ගේ මරණයෙන් පසු 1806 දී උඩගම්පහේ අදිකාරම් ධුරයටද පත්විය. ශ්‍රී වික්‍රම රජු විසින් 1812 දී

ඇහැලේපොලගේ මයිලනුවන් වූ පිළිමතලව්වෙ මහ අදිකාරම් මරණයට පත් කරනු ලැබීමෙන් හිස් වූ මහ අදිකාරම් පදවියද ලැබුණේය. වැඩිකල් නොයවා ඇහැලේපොල නිලමේ නායක්කාර වංශික තම වඩිග රජුගේ කෲරකම් වලට විරුද්ධව සටන් වැදීමට පෙරමුණ ගත්තේය. ඔහුගේ අදහස වූයේ නායක්කාර රජු පලවා හැර උඩරට උරුමය සිංහලයින් අතට ලබා ගැනීමය. ඒ සඳහා ඉංග්‍රීසීන්ගේ සහාය ගැනීමට ඔහු තීරණය කළේය. ඉංග්‍රීසිහු යටි සිතේ වෙනත් පරමාර්ථ තබා ගෙන ඇහැලේපොලගෙන් ප්‍රයෝජන ගත්තෝය.

තමන්ගේ අරමුණ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය පතුරුවා හැරීම නොවන වග තිබිය දී ජනතාවට ඒත්තු ගැන්වීමට ඉංග්‍රීසිහු උත්සාහ කළහ. 1814 මාර්තු මාසේ 4 හා 5 වනදා එක්නැලිගොඩ හමු වූ ජෝන් ඩොයිලි නැමැති බ්‍රිතාන්‍ය කොමසාරිස්වරයා කියා සිටියේ ද ප්‍රදේශ ලාභයක් බ්‍රිතාන්‍ය ආධිපත්‍යයේ ව්‍යාප්තියක් තම අරමුණ නොවන බවය. වෙළඳාම හා සාමය පමණක් තම අරමුණ බව දැන්වීම නිසා මෙය විශ්වසිය යුතු ප්‍රකාශයක් ලෙස එකල උඩරට ප්‍රභූන් කවුරුත් පිළිගත්තා නොඅනුමානය. [3] මේ වන විට මහනුවරත්, මුළු මහත් කන්ද උඩරටත් කැළඹීමට පත්ව තිබූ වකවානුවකි. ජනතාවගේ ප්‍රාර්ථනය වූයේද වඩිග රජු පලවා හැර ඇහැලේපොල රජවනු දැකීම ය. රජුගේ තර්ජනය වැඩිවිය. ඇහැලේපොල නිලමේ ඩොයිලිගේ මාර්ගයෙන් ඉංග්‍රීසීන්ගෙන් ආධාර පැතීය. 1814 මැයි 8 වන දින ඩොයිලි වෙත ලිපියක් යවමින් තමන් යුද්ද කොට අල්ලා ගන්නා සියලුම පළාත් වලට උදව් උපකාර කිරීමටත්, තමන්ගේ ගෞරවය හා තනතුරුද, ආගමද ආරක්ෂා කිරීමටත් පොරොන්දු වෙතොත් බ්‍රිතාන්‍යයන්ට යටත් වීමට පවා කැමති බවත් දැන්විය. [4] එහෙත් මැයි මස 12 වනදා වන විට තවදුරටත් තමන්ගේ ඉල්ලීම් සැහැල්ලු කරමින් උඩරට පළාත් කිසිදු බැඳීමකින් තොරව ඉංග්‍රීසි නට පවරා දීමට පවා කැමති විය. [5] මෙ තත්ත්වය ගැන ඩොයිලි විසින් බ්‍රවුන්රිග් වෙත දන්වනු ලැබී ය. නිසි අවස්ථාව එළඹී ඇති බව බ්‍රවුන්රිග් දැන ගත්තේය. මැයි 21 වනදා ඇහැලේපොලට සහනදායී පිළිතුරක් ලැබුණි. රජුට විරුද්ධව කරන කැරැල්ලේ දී රහසේ උපකාර කිරීමට පොරොන්දුව වන අතර, රජුට විරුද්ධව මෙම කැරැල්ල මෙහෙයවනු ලබන්නේ ඉංග්‍රීසීන් බව කිසිසේත් ඇඟවීමක් නොකළ යුතු බවට වග බලා ගත යුතු බව ද එහි සඳහන් විය. [6] මේ අනුව ඉංග්‍රීසින්ගෙන් ආධාර ලබා එක්නැලිගොඩගේද සහාය ඇතිව ඇහැලේපොල සටන දියත් කළේය. ඇහැලේපොල රාජද්‍රෝහියෙකු වශයෙන් සලකා ශ්‍රී වික්‍රම රාජසිංහ ඔහුගේ මුළු පවුලම විනාශ කොට දැමුයේද ඒ හේතුවෙන් බව කියනු ලැබේ. (ඇහැලේපොල පවුල ඝාතනය කරන ලද්දේ ඇහැලේපොල නිලමේගේ රාජද්‍රෝහී ක්‍රියා නිසාමද නැතහොත් ඇහැලේපොල කුමාරිහාමි පිළිබඳ රජුගේ සිතැඟි ඉටු නොවූ නිසාද යන්න වෙනමම සලකා බැලිය යුතු ප්‍රශ්නයකි.) තමන් යුද්ධයට ඉදිරිපත් වූයේ ද ඇහැලේපොල නිසාම බව බ්‍රිතාන්‍ය හමුදා නිලධාරීහු පවා පිළිගත් හ. [7] මේ අනුව කන්ද උඩරට රාජ්‍යයට විරුද්ධව ඉංග්‍රීසින් එළි පිටම කළ සටනේ පසු පස බලවේගය වූයේද ඇහැලේපොල ය.

කන්ද උඩරට ආක්‍රමණය කොට 1815 පෙබරවාරි 18 වනිදා රජතුමාද අල්ලා ගැනීමට හමුදාව දුම්බර මැද මහ නුවරට යවන ලද්දේද ඇහැලේපොල විසිනි. මෙසේ ඉංග්‍රීසින්ගේ උපකාරයෙන් උඩරට රාජාධිරාජ අල්ලා ගැනීමේ කාර්යය ඇහැලේපොල විසින් නිමාවට පත් කරන ලදී. ඇහැලේපොල ඝාතනයෙන් මුළු රට කම්පා වී ගිය සැටි මෙතරම් ඉක්මණින් ජනතාවට අමතක වී යා නොහැක. ඔවුනු දින දෙකක්ම ආහාර නොගත්හ. ළිපගිනි නොමැලවූහ. ශෝකයෙන් හා කම්පාවෙන් මුළු මහත් නගරයම ඇලලී ගිය සැටි මෙම සිද්ධිය සිදු වී අවුරුදු දෙක තුනකට පසුව වාර්තාගත කිරීමට ඩේවිට අවස්ථාව ලැබුණේ ඒ නිසා විය යුතුය. [8] මුළු මහත් ජනතාවක් තාඩනයට හා පීඩනයට පත්කොට සිංහල වීරවරයෙකුගේ දරු පවුල, සාහසිකව ඝාතනය කළ කෲර රජ කෙනෙකු සිහසුනෙන් නෙරපා හැර ජයග්‍රහණයලද මෙ වැනි මොහොතක ජනතාව උදම්වෙද්දී [9] ඇහැලේපොල නව රජු වශයෙන් පිළි ගැනීමට ජනතාව බලා සිටියාට සැකයක් නැත. [10] ඩොයිලි 1815 පෙබරවාරි 27 වෙනි දින ඇහැලේපොල නිලමේ හමු වීමට ගියේය. එහිදී ඇහැලේපොල ඩොයිලිගෙන් ඉල්ලීමක් කළේය. රජෙකුට බඳු ගෞරවනීය පදවියක් තමාට නොලැබෙතොත් විශ්‍රාම ගැනීමට ඔහු අවසර පැතීය. ඉංග්‍රීසීන්ගේ සිත වෙනස් වී රාජ්‍යය පිළිබඳ කෑදර සිත මතු වී ඇති සැටි ඔහුට අවබෝධ විය. ඇහැලේපොල පෙබරවාරි 28 වන ද ආණ්ඩුකාර බ්‍රවුන්රිග් හමු වී අප්‍රසාදය පළ කර සිටියේ තමාට කිසි පදවියක් අවශ්‍ය නොවන බව දන්වමිනි. ඔහුට එදින මුදලින් පිරිනැමුණු පඬෝදි දෑසක පාරිතෝෂිකයද ඔහු මහත්මයෙකු සේ ප්‍රතික්ෂේප කළේය. [11] 1815 මාර්තු 2 වැනිදා සිංහල පැය ක්‍රමයට ඉර මුදුන් වී දහ පැයක් ඉක්ම වූ කල ඉංග්‍රීසි හා සිංහල ප්‍රභූ පිරිසක් මහනුවර මඟුල් මඩුවට එක්රැස් වූහ. ඉංග්‍රීසි රජු නියෝජනය කරමින් පැමිණ සිටි අමුත්තන් ඉදිරියේ ඉංග්‍රීසි ධජය එසවූ බ්‍රවුන්රිග් නිල වශයෙන් උඩරට රාජ්‍යය බ්‍රිතාන්‍ය කිරුළට ඈඳා උඩරට ගිවිසුම නමින් හැඳින්වෙන වගන්ති දොළොසකින් යුත් ලේඛනයක් ඔවුන් ඉදිරියේ කියවා අදිකාරම් වරුන් හා දිසාවේ වරුන්ගේද අනුමැතිය හා අත්සන සඳහා ඉදිරියේ තැබීය. අද අප දකින එම ගිවිසුමට අත්සන් තබා ඇති උඩරට ප්‍රභූන්ගේ නම් අතර පෙරමුණේ ඇත්තේද ඇහැලේපොල නමයි. එහෙත් එම ගිවිසුමට උඩරට ප්‍රභූන් සියළු දෙනා එක්වර අත්සන් නොකළ බවද සමහරුන් මාර්තු 10 වැනි දින අත්සන් තැබූබවද ඩොයිලිගේ දින පොතින් පැහැදිලිවේ. [12] ඇහැලේපොල ගලගොඩ හා පිළිමතලව්වේ අත්සන් කර ඇත්තේ මාර්තු 18 වැනිදාය. [13]

මේ අනුව මාර්තු 2 වන ද උඩරට ගිවිසුමට උඩරට වැදගත් ප්‍රභූන් එක්වර අත්සන් නොතැබූ බව පෙනේ. උඩරට ගිවිසුම ක්‍රියාත්මක වූ 1815 මාර්තු 2 වනදා වත් ඇහැලේපොලට සැලකීමට තබා ඔහුගේ ඉල්ලීමට ගරු කිරීමට තරම්වත් ඉංග්‍රීසිහු කෘතවේදී නොවූහ. මාර්තු 11 වනදා ආණ්ඩු කාරවරයා හමු වූ ඇහැලේපොල වැලපෙමින් කියා සිටියේ ඉංග්‍රීසීන්ට පක්ෂපාතී වීම නිසා සිය ඥාතීන්ද,, ගේ දොර ඉඩකඩම් ද නැති වූ බවය. ඔහුට සෑහෙන දීමනාවක් ගෙවන බවට පොරොන්දු වෙමින් කොළඹට පැමිණ ජීවත් වන ලෙස ආණ්ඩුකාරවරයා ඔහුගෙන් ඉල්ලීමක් කළේය. රජකම පැතූ ඇහැලේපොලට ගමන්,, බීමක් පවා දුන් නැති බව සතුරන්

පවසන සැටිත් මෙහිදී ඇහැලේපොල ආණ්ඩුකාර වරයාට මතක් කර සිටියේය.[14] ඇහැලේපොල 1815 මාර්තු 15 වැනිද ද ඩොයිලි හමු වී තමන්ගෙන් සිදු වූ සේවාවට සලකන සේ ඉල්ලා සිටියේය.[15] උඩරට රාජධානිය ඉංග්‍රීසින්ට යටත් වී දුන් දින පහළොවක් ගත වී ඇත. 1815 මාර්තු 18 වැනි දින දහවල් 3.00 ට පමණ ඇහැලේපොල නැවතත් බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර රොබට් බ්‍රවුන්රිග් මුණ ගැසුනේය. තමන්ට සියළු දේ අහිමි වී කිසිවෙකුත් නැතිව සිටින මේ මොහොතේ මීගස්තැන්නේ අදිකාරම්ගේ වැන්දඹුව වූ පිළිමතලව්වේ මහ අදිකාරම්ගේ වැඩිමහල් දියණිය හා විවාහ වීමට අදහස් කරන බවත් ඒ සඳහා පගෝදි 2000 හෝ 3000 ක් අවශ්‍ය බවත් කියා සිටියේය. ඔහුට පගෝදි 5000 ක් පිරිනැමීමට ආණ්ඩුකාර වරයා එකඟ වූයේ එතැනින් තමාගේ බැඳීම අවසාන වන බව සිතා විය යුතුය. එසේ වුවද පරිත්‍යාගය ගැන ප්‍රශංසාව පළකළ ඇහැලේපොල බ්‍රිතාන්‍ය රජයට සේවය කිරීමට පොරොන්දු වෙමින් මේ අවස්ථාවේදි නැවතත් ඔහුගේ ඉල්ලීම ඉදිරිපත් කළේය. සමහරු තමන්ට අප්‍රසාදය පළ කරමින් අවමානයෙන් යුතුව දෙස් පවරන බවත්, ඒ නිසා උඩරටියන් සියළු දෙනාටම ප්‍රමුඛ වන පරිදි සිංහලයන් කිසිවෙකුටත් ලැබිය නොහැකි ගෞරවනීය පදවියක් ලැබිය යුතු බවත් ඉල්ලා සිටියේය. ලංකාවේ බ්‍රිතාන්‍ය රජයේ නියෝජිතයාට දෙවන නොවන කුමන පදවියක් හෝ පිරිනැමීම ගැන ඔහු නැවතත් ආණ්ඩුකාර වරයාගේ අවධානය යොමු කළේය. තමන්ගේ අපේක්ෂාව ලියා ඉදිරිපත් කරන ලෙසටත් එවිට ගෞරවනීය පදවියක් පිරිනමන බවටත් ආණ්ඩුකාරවරයා එහිදී පොරොන්දු විය.[16]

බ්‍රිතාන්‍ය ආණ්ඩුකාර වරයා සිංහලේ රජු වශයෙන් දූත් සැලකෙන නිසා ඇහැලේපොල ඉල්ලා සිටියේ යුවරජ පදවිය හා සමාන තනතුරක් බව පැහැදිලිය. එදිනම රාත්‍රි භාගයේ දී ඇහැලේපොල උඩරට ගිවිසුමට තම අත්සන යොදන්නට ඇත්තේ කොළඹට පිටත් වීමට ආසන්නව සිටි බ්‍රවුන්රිග් ආණ්ඩුකාරවරයාගේ වචනය නැවතත් විශ්වාස කළ නිසා විය යුතුය. මුළු රටත්, ජනතාවත්, ඇහැලේපොල රජ වූ බව ඇසීමට හෝ යුවරජ වූ බව ඇසීමට පුල පුලා සිටියා නොඅනුමානය.[17] ශ්‍රී වික්‍රම රාජසිංහ අල්ලා ගත් අවස්ථාවේදී රාජ්‍ය භාණ්ඩ භාරව සිටි සට්ටඹිරාළ රජු ගේ ආභරණ වලින් කොටසක් ඇහැලේපොලට දුන්නේද ඔහු රජ වෙතැයි යන අදහසින් විය යුතුය, තමාගේ බලයෙන් උඩරට අල්ලා ගත් ඉංග්‍රීසින් හමුවේවත්, ඉමහත් බලාපොරොත්තුවකින් සිටි සිංහල ජනතාව හමුවේවත් යුවරජෙකු සේ පෙනී සිටීමට තරම් ආත්ම ශක්තියක් හා අයිතියක් ඇහැලේපොලට විය. පෙර රජතුමා රාජශ්‍රීයෙන් නගරයේ ගමන් කළ පරිදි පිරිවර ජනයා සහිතව ඇහැලේපොලද සුදු අසෙකු පිට නැගී නගරයේ ගමන් කළේය.[18] මහජනතාව ඔහුට ගෞරවයෙන් යුවරජු - දෙවෙනි රජ්ජුරුවෝ මහ නිලමේ ආදී වශයෙන් ඇමැතීමට පුරුදුව සිටි වග ඇහැලේපොල වර්ණනාව වැනි කෘතීන්ගෙන් හා වෙනත් ලේඛනයන්ගෙන් පවා පැහැදිලි වේ.[19] ආත්මාර්ථකාමී ඉංග්‍රීසිහු ඇහැලේපොල පිළිබඳ සැක යෙන් ජීවත් වූහ. ඇහැලේපොල රජ කෙනෙකු වශයෙන් මහජනයා ඉදිරියේ පෙනී සිටීමට ගත් සෑම උත්සාහයක්ම ඉංග්‍රීසීන්ගේ මෙන්ම මොල්ලිගොඩ, මිල්ලව වැනි අනිත් සිංහල ප්‍රභූන්ගේ ද අප්‍රසාදයට හා කනස්සල්ලට භාජනය වූ බව ඩොයිලිගේ දින පොතින් පැහැදිලි වේ.[20] රජුගේ රාජාභරණ පවා වංචා සිතින් සඟවා ගෙන සිටිනා බවට ඉංග්‍රීසීන් සැකකළ සැටි බ්‍රවුන්රිග් ආණ්ඩුකාරයා එංගලන්තයේ යටත් විජිත භාර ලේකම් වරයාට 1816 - 11 05 හා 1818 - 7 – 24 දින වල යැවූ ලිපිවලින් මනාව පැහැදිලි වේ.[21] එහෙත් ඇහැලේපොල 1815 මාර්තු 12 වන දින ආණ්ඩුකාර වරයාට අන්තිම රජුගේ ආභරණ භාරදුන් වග ඩොයිලි සඳහන් කරයි[22].

දළදා වහන්සේ නැවත මහනුවරට වැඩමවා ලීම ඉංග්‍රීසීන්ගේ මීළඟ බලාපොරොත්තුව විය. දළදා වහන්සේගේ භාරකාරකත්වය රාජ්‍යයේ සංකේතය බව ඒ වන විට ඔවුහු දැන සිටියෝය. උත්සව සංවිධානය විය. 1815 අප්‍රේල් 24 වැනිද පුසුල්පිටියේ සිට හිඳගලටත්, හිඳගල සිට මහ පෙරහරින් මහනුවරටත් දළදා වහන්සේ වැඩම කරන ලද්දේය[23]. මේ පෙරහරේ පසු පස ඇහැලේපොල අස්වයකු පිට නැගී පිරිවර සමඟින් ගමන් ගත්තේය. එයද ඉංග්‍රීසීන්ගේ උදහසට ලක් වූවා නොඅනුමානය. ඇහැලේපොලගේ බලාපොරොත්තු මෙන්ම උඩරට ජනතාවගේ අපේක්ෂා වන්ද බිඳ වැටෙමින් පැවතින. තමන් කරගත් මෝඩකම ගැන සිංහල ප්‍රභූන්ගේ ඇස් ඇරෙමින් පැවතින. ඉංග්‍රීසි පාලනය කෙරෙහි ජනතා විරෝධය යටින් ලියලමින් පැවතින. මෙ වූකලී 1817 - 18 ඉංග්‍රීසීන්ට විරුද්ධව ඇති වූ උඩරට මහ කැරැල්ලේ පසුබිම නිහඬව සකස් වෙමින් පැවතුන අවදියකි.[24] උඩරට ගිවිසුමෙ ප්‍රකාර හතරවැනි වගන්තියෙන් උඩරට රාජ්‍යය තුන්වන ජෝර්ජ් රජතුමන් හට පවරන ලද වුවත් අදිකාරම්, දිසාවේ, මොහොට්ටාල, කෝරාල, විදානේ හා අනෙකුත් මූලාදෑනීන්ට ඔවුන්ගේ බලතල හා සම්බන්ධ අයිතිවාසිකම් හා සමාන වරප්‍රසාදද බලතලද කවර ගණයක වුවත් ජනතාවගේ සම්මත චාරිත්‍ර හා ඔවුන්ගේ දේපොල හා අයිතිවාසිකම්ද සහතික කරන ලදී. එසේම බුද්ධාගමට හානියක් නොපැමිණෙන බවටත් පූජා පිළිවෙත්ද පූජනීය ස්ථානද සංඝයා වහන්සේද බ්‍රිතාන්‍ය රජය විසින් ආරක්ෂා කරන බවටත් ඉංග්‍රීසීන් පස්වෙනි වගන්තියෙන් ප්‍රතිඥා දෙන ලදී. එහෙත් ඒ සියල්ල කඩ කරමින් ඔවුහු කටයුතු කළහ. උඩරට ජනතාව ඉමහත් කනස්සල්ලෙන් කල් ගෙවූහ.

මෙ වැනි අවස්ථාවක ජාතිය වෙනුවෙන් ඇහැලේපොල වෙත පැවරී තිබුනේ ඉමහත් වගකීමෙකි. ඔහුගේ සිත ජාතිමාමකත්වයෙන් හා ආගම භක්තියෙන්ද ඔදවැඩී ගියේය. ඇහැලේපොල පිළිබඳව ඉංග්‍රීසීන්ගේ සැකය 1815 අප්‍රේල් මාසයේ සිටම පැවතින.[25] මරණයට පත් වූ තම පවුලේ උදවියට පිං පිණිස දිනපතා දවස් ගණනක් මහා සංඝයා වහන්සේට මතක දානය පිරිනැමූ ඇහැලේපොල තමන් සතු මුතු මැණික්, රන් රුවන්, ප්‍රයෝජනයට ගෙන දළදා හිමි ආරක්ෂා කොට වඩා හිඳුවා තැබීමට මේ අවස්ථාවේදී රන් කරඬුවක් පූජා කළ බව හෙළි වෙනොත් එය ආශ්චර්යයට හේතුවක් විය නොහැක. එක් අතකින් ජාතියේ අනාගතය මෙන්ම එතුමන්ගේ කලකිරීමද ආගම කෙරෙහි නැඹුරු වූ ජීවිතයද එයින් පිළිබිඹු වෙයි. අඩියක් පමණ උසට රනින් කළ දළදා කරඬුවක් අදත් මහනුවර දළදා මාලිගාවේ වැඩ වෙසෙයි. එය ඇහැලේපොල පූජා කළ කරඬුවකි. මහජනතාවට

දැක්මට අවසරයක් නොමැති එම කරඬුව ඇත්තේ දළදා හිමි වැඩ වෙසෙන කරඬු සතකින් සෑදි (නොයෙකුත් වටිනා ආභරණයන් පළඳා විසිතුරුව ඇති) අප දකින මහ කරඬුව යට ඇති තුන් වැනි කරඬුව තුළය. අස්ගිරි කරඬුවයයි ව්‍යවහාර කෙරෙන මෙම කරඬුවේ යතුර අස්ගිරි මහා විහාරයේ මහානායක මාහිමියන් භාරයේ පවතී. එම කරඬුවෙහි පාදම වටා ඇහැලේපොල විසින්ම කොටවා ඇති අභිලේඛනය මගින් ඔහු විසින් කරන ලද පූජාව පිළිබඳව විස්තරය මෙසේ අනාවරණය වේ.

ශ්‍රී සත කනක කාන්තිස්පූරිත වරවරණ සරසීරුහ ප්‍රශස්ත සම්යක් ශාලන්කෘත පරනෘපති ගජේන්ද්‍ර වෘන්ද කේසරින්ද්‍රායමාන වූ ඇහැලේපොල විජේසුන්දර වික්‍රමසිංහ චන්ද්‍රශේඛර අමරකෝන් නාමාග්‍ර මහසේනාධිපති මන්ත්‍රීශ්වරයාණන් විසින් සර්වලොකොත්තම සර්වඥතාඥාන යථාර්ථ සර්වඥතා ඥානය ප්‍රාර්ථනා කොට සාරසිය විසි එකක් පමණ සුවර්ණධරණයෙන් හිරණ්‍යගර්භ මකුටාකාර කාන්‍දවත කරණ්ඩක මස්තකාභිබද්ධ මහානීල වජ්‍රරත්නප්‍රභූති එක්සිය විස්සක් පමණ වජ්‍රමාණික්‍යයන්ද විසියක් පමණ ඉන්ද්‍රනීල මාණික්‍යයන් ද එක් දහස් නවසිය එකක් පමණ ලෝහිතාංක මාණික්‍යයන් ද, එක්සිය අසූ හතක් පමණ මරකත මාණික්‍යයන් ද වෛඩූර්ය හතරක් හා එපමණ පුෂ්පරාග මාණික්‍යයන් ද, සොළසක් පමණ මෞක්තික යන් ද යන දෙදහස් දෙසිය හතලිස් දෙකක් පමණ මාණික්‍යරත්න බද්ධ ප්‍රසිද්ධාති ශුද්ධාභිවර්ණ සුවර්ණයෙන් කරවන ලද ප්‍රවරතර පරමරමණීය වූ මේ කරඬුව ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදහස් තුන්සිය සැටට පැමිණි වෘෂභ සංවත් සරයෙහි නිකිණි මස පුර පංචමී තිථිය ලත් රවිදින මෙදවස ජිනවදන සරසීරුහ රාජහංසායමාන ශ්‍රී දන්තධාතූන් වහන්සේ වඩා පූජා කරන ලදී.

## අරුත

ශෝභා සමූහ නැමති රුවන් කාන්තිය පැතුරුනාවූ ද, උතුම් පාද නැමති පද්මය සේ පසන්නා ලද්දා වූද, සර්වප්‍රකාරයෙන්ම ශෝභාමත් වූ රජ වරුන් නැමති ඇත් සමූහයාට සිංහයෙකු හා සමාන වන්නාවූද, ඇහැලේපොල විජේසුන්දර වික්‍රමසිංහ චන්ද්‍රසේකර අමරකෝන් නම් වූ අග්‍ර මහා සේනාධි පති මන්ත්‍රීශ්වරයාණන් විසින් උතුම් වූ සර්වඥතාඥානය නමැති සම්මා සම්බුද්ධත්වය ප්‍රාර්ථනා කොට හාරසිය විසි එකක් පමණ වූ රන්කළඳින් මහබඹු කිරුළ බඳු කොට තැනවූවා වූ රන්කරඬුව මුදුනේ බැඳි මානැඹි වජ්‍රරත්නයෙන් අතිශයවූ එකසිය විස්සක් පමණ වූ වජ්‍රමාණික්‍යයෙන් ද විසිම යක් පමණ වූ ඉන්ද්‍රනීල මාණික්‍යයෙන් ද, එක්දහස් නවසිය එකක් පමණ වූ රතු මාණික්‍යයෙන් ද, එකසිය අසූහතක් පමණ වූ මරකත මාණික්‍යයෙන් ද වෛඩූර්ය සතරක් හා ඊ ප්‍රමාණ වූ පුෂ්පරාග මාණික්‍යයෙන් ද දහසයක් පමණ වූ මුතු වලින් ද වශයෙන් දෙදහස් දෙසිය හතලිස් දෙකක් පමණ වූ මාණික්‍ය රත්නයන් බැඳි ප්‍රකට වූ අතිශෝභාසම්පන්න වර්ණයෙන් පැහැපත් වූ රනින් කරවන ලද ඉතා රමණීයවූ අති උතුම් මේ කරඬුව බුද්ධ වර්ෂයෙන් දෙදහස් තුන්සිය හැටට පැමිණි වෘෂභ නම් වූ සංවත්සරයෙහි නිකිනි මස පුර පංචවී තිථියලත් ඉරු දින වූ මේ දවසේ බුදුන් වහන්සේගේ ශ්‍රී මුඛය නැමති පද්මයෙහි රාජ හංසයෙකු වැනි වූ ශ්‍රී දන්තධාතූන් වහන්සේ වඩා හිඳුවා පූජා කරන ලදී.

මෙම ලිපියෙන් පැවසෙන ප්‍රධාන කරුණු සතරෙකි. එනම්,

1 දළදා කරඬුව පූජා කළ දිනය,
2 එකල ඇහැලේපොලගේ තත්වය,
3 දළදා හිමි වඩා හිඳුවා පූජා කළ කරඬුවේ අගය හා,
4 එසේ පූජා කිරීමෙන් ඔහු කළ ප්‍රාර්ථනයත් ය.

මෙම ලේඛනයේ බුද්ධ වර්ෂයෙන් දක්වා ඇති දිනය ක්‍රි: වර්ෂයෙන් මැන බැලුවහොත් එය 1816 අගෝස්තු මස 25 වෙනි ඉරිදා දිනට වැටෙ. මෙ වන විට ද, ඇහැලේපොල ස්වකීය තත්වය අභිමානයෙන් යුතුව සිතෙහි ආරෝපනය කරගෙන තිබූ අන්දම තම පාද ජනතාව විසින් පසස්නා ලද බව පැසසීමෙනුත් සියළු රජවරුන් ඇත් සමූහයාට උපමා කළහොත් ඒ අතර, සිංහ රාජයෙකු සේ වර්ණනාකර තිබීමෙනුත්, අග්‍රමහාසේනාධිපති මන්ත්‍රීශ්වරයා වශයෙන් තමා හඳුන්වාගෙන තිබීමෙනුත් පෙනී යයි. එවැනි තිලයක් තමාට නොතිබුන ද ජනතාව එතුමන් සැලකූ අන්දම මෙයින් පැහැදිලි වේ. දෙදහස් දෙසිය හතලිස් දෙකක් පමණ මාණික්‍ය රත්නයෙන් අලංකාර කොට රනින් නිම කළ ඇහැලේපොල කරඬුව මුදලින් අගය කළ නොහැකි අගනා වස්තුවක් බව විස්තරයෙන් පෙනේ. මෙවැනි අගනා පූජාවක් දළදා හිමියන් වෙනුවෙන් කළ ඇහැලේපොලගේ ප්‍රාර්ථනය වී ඇත්තේ මතු බුදු බව ලැබීමය. මෙකී කරුණු සතර තුළින් ඉස්මතු වන්නේ එකල ඔහුගේ තත්වයත් මානසික ස්වභාවයත්ය.

උඩරට රාජධානිය ඉංග්‍රීසිනට පැවරී අවුරුදු එක හමාරක් ගතවී ඇතත් තම තත්වය හා බලාපොරොත්තුව ජනතාව ඉදිරියේ ඔහු නොපැකිලව හෙළි කළේය. වර්ෂ 1917 දී ඉංග්‍රීසීන්ට එරෙහිව උඩරට මහ කැරැල්ලට කටයුතු සෙමින් සංවිධානය විය. සිංහලයන්ගෙන් උඩරට රාජධානිය ඉංග්‍රීසීන් කොල්ල කෑවේ වංචාවෙනි. ඇහැලේපොල වැනි කාරුණික හදවත් ඇතියවුන් රැවටීමෙනි. උඩරට ගිවිසුම උඩරට ප්‍රභූන්ගේ අපේක්ෂාව නොවූ අතර, ඉංග්‍රීසි ආණ්ඩුව ජනතාවගේ අපේක්ෂාව නොවීය. මේ දෛවෝපගත සිද්ධීන් දෙකකි. උඩරට මහ කැරැල්ල තුළින් ඇහැලේපොල ජාතියට අහිමි විය කැප්පිටිපොල මඩුගල්ලේ ඇතුළු දහස් සංඛ්‍යාත සිංහලයින්ගේ ජීවිත නිදහස වෙනුවෙන් සතුරන් හමුවේ නැති විය. එදා සිංහලයන් වෙතින් ඉංග්‍රීසීන් උඩරට කොල්ලකා තම පාලනයට යටත් කළ විට සිංහල රජකු තමනට නැතිවූ වග රට වැසියන් කාටවත් දුනෙන්නට ඇත.

1 අනේ කුහුඹියනේ
නොපටන් රජෙක් ඉන්නේ
මොකදෑ කරන්නේ
අපේ කරුමේ වන්නේ

2 රජෙක් ලැබුනොත්
එදා කිරිබත් කන්නත්
පෙරහැර කරන්නත්
සාදු නාදින් ගිගුම් දෙන්නත්

යයි කියමින් මග සහන පවා වැලපුනේ ඇහැලේපොල ගැන සිතා නොවිය හැකිද?

## ආශ්‍රිත ග්‍රන්ථ


1 Codrington H. W. ed. Diary of Mr. John D' oyly
Colombo, 1917 pg. 231

2 ඇහැලේපොළ සත්නසයේ මොහු ගේ නම සඳහන්ව ඇත්තේ 'ඇහැලේපොළ විජයසුන්දර වික්‍රමසිංහ චන්ද්‍රසේකර සෙනෙවිරත්න මුදියන්සේ ' යනුවෙනි. බලන්න විමලානන්ද, තෙන්නකෝන් - උඩරට කැරැල්ල තුන්වන කාණ්ඩය, කොළඹ 1963 පිටු 244 - 255

3 Silva, Colvin R, de. Ceylon under the British Occupation
Vol. 1 Colombo 1953, pg. 142.

4 Ibid. pg. 146

5 Ibid.

6 Ibid. pg. 147

7 Pieris, P. E. Sinhalese and the Patriots 1815 - 1818.
Colombo 1950 pg 8

8 Davy, John, Account of the Interior of Ceylon 2nd Ed.
Colombo 1969. pg. 243

9 Diary of Mr. John D' oyly Colombo 1917. pg. 241

10 ප්‍රනාන්දු ඇම්. ඊ. සං: ඇහැලේපොළ වණ්නාව කවි 171 - 172

11 Diary of Mr. John D' oyly, Colombo. 1917. p. 223

12 Ibid pg. 231

13 Ibid. pg. 237

14 Ibid. pp. 231 - 232.

15 Ibid. pg. 223

16 Ibid. pp. 234 - 235

17 Account of the Interior of Ceylon pg. 243
අබයසිංහ දේවරාජ, සෝමරත්න. උඩරට රාජධානිය
1470 - 1818, කොළඹ 1977 - 126 පිට

18 Diary of Mr. John D'oyly pg. 254

19 ඇහැලේපොළ වණ්නාව, යුවරද 1, 76, 80, 130, 154 යන කව
යුවරාජ 16, 86, 93, 94, 101 163, 221 යන කව
උපරාජ 134. 268 යන කව
උඩරට කැරැල්ල - තුන්වන කාණ්ඩය කොළඹ 1963 - මහ නිලමේ
දෙවෙනි රජ්ජුරුවෝ 243 පිටුව

20 Diary of Mr. John D' oyly pp. 254, 256.

21 විමලානන්ද, තෙන්නකෝන්, උඩරට කැරැල්ල දෙවන කාණ්ඩය
කොළඹ 1962, 13 හා 186 පිටු

22 Diary of Mr. John D' oyly pg. 232

23 Ibid. pp. 266 - 269

24 An Account of the Interior of Ceylon. pg. 243.

25 Diary of Mr. John D' oyly pg. 262


(ඇහැලේපොල කරඬුව ලිපිය සපයා දීමෙන් අනුග්‍රහ කළ මහනුවර අස්ගිරි මහා විහාර වාසි අතිගරු අඹගස්වැවේ රතනපාල හිමියන්ට මගේ ගෞරවය හිමිවේ.)